**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය 2021**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍යප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේමූල්‍ය ප්‍රකාශන තුළින්2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

**------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින්නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හාඅන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී වැඩ නිම කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක් සඳහා වැයකර තිබුණු රු.10,893,922 ක් කෙරීගෙන යන වැඩ ගිණුමෙන් අදාළ වත්කම් ගිණුම්වලට මාරුකර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණවල පිරිවැය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. තවද, එම වත්කම්වලට අදාළ රු.406,566 ක් වූ ක්ෂය ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඊට සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණි. තවද ඉකුත් වර්ෂයේදී වැඩ නිම කර තිබුණු නමුත් ප්‍රාග්ධනගත කර නොතිබුණු ගොඩනැගිලි නොවන වත්කම් වෙනුවෙන් වැයකර තිබුණු රු.15,767,310 ක් සමාලෝචිත වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ගොඩනැගිලි ගිණුමට මාරුකර තිබීම හේතුවෙන් ඊට සමාන අගයකින් එම වත්කම් ගිණුම්වල පිරිවැය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වැරදි නිවැරදි කරන බව. | කෙරීගෙන යන වැඩ වත්කමක් ලෙස හඳුනාගෙන ප්‍රාග්ධන ගත කිරීම හා ක්ෂය කිරීම නිසි වේලාවට සිදුකළ යුතු අතර සිදුවී ඇති වැරදි නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලය විසින් 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අනුරාධපුර ශික්ෂණරෝහල් භූමියේ ඉදිකළගොඩනැගිලි 02 ක් සඳහා වැයකර තිබුණු රු.1,027,676,497 ක් ප්‍රාග්ධනගත කර තිබුණි. තවද එම කාලපරිච්ඡේදය තුළදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.23,999,000 ක් වූ වෛද්‍ය උපකරණ වෙනුවෙන් ආරම්භයේ සිටම ක්ෂය කළ යුතුව තිබුණු රු.16,799,300 ක් ක්ෂය කර නොතිබුණි. එසේම එම වත්කම් ඉඩමේ හිමිකාරිත්වය ඇති ආයතනය වෙත විධිමත් ලෙස පවරා දීමටකටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් සියල්ල අනුරාධපුර ශික්ෂණ රෝහල විසින් පවත්වාගෙන යනු ලබන වත්කම් වන බව, ඉදිරියේදී පැවැත්වීමට නියමිත විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරඑම වත්කම් අනුරාධපුර ශික්ෂණරෝහලට භාරදීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව හා 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී වැරදි නිවැරදි කරන බව. | ඉඩමේ හිමිකාරිත්වය ඇති ආයතනය වෙත මෙම වත්කම් විධිමත් ලෙස පවරා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | උපලබ්ධි අගයක් නොමැති පිරිවැය රු.4,730,583 ක් වූ කල් ඉකුත්වූ තොග වර්ෂය අවසන් ඉතිරි තොගයට ඇතුළත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් වැඩියෙන් දැක්වේ. | මේ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටු 03 ක් පත්කර ඇති බව, එම කමිටු වාර්තා ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශය මත පාලක සභා අනුමැතිය ලබා ගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ශුද්ධ උපලබ්ධි අගයක් නොමැති කල් ඉකුත්වූ තොග ලාභයට එරෙහිව විධිමත් ලෙස කපාහළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.69,717,263 ක් වූ බැඳුම්කර කඩකළ ණයගැති ශේෂය තුළ තිබුණු රු.3,784,401 ක් වූ බැඳුම්කරය සමාලෝචිත වර්ෂයේදී 2023 වර්ෂය දක්වා බලපැවැත්වෙන පරිදි අළුත්කර තිබුණු බැවින් එම අගය ණයගැති ගිණුමෙන් ඉවත් කළ යුතුව තිබුණු නමුත් එපරිදි කටයුතු කර නොතිබුණු බැවින් 2021 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර කඩකළ අරමුදල් ගිණුම හා බැඳුම්කර කඩකළ ණයගැති ගිණුමේ ශේෂ ඊට සමාන අගයකින් වැඩියෙන් දැක්වේ. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | 2023 වර්ෂය දක්වා බලපැවැත්වෙන පරිදි අළුත්කර තිබුණුබැඳුම්කර වටිනාකම රු.3,784,401 ක් ණයගැති ගිණුමෙන් ඉවත් කර නිසි පරිදි ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාල පරාසයක් තුළදී ලැබී තිබුණු නමුත් හඳුනා නොගත් රු.2,711,041 ක් විවිධ තැන්පත් ගිණුමට බැර කර තිබුණි. | විශ්වවිද්‍යාල බැංකු ගිණුමට බැරවී තිබෙන නමුත් හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කරන තෙක් විවිධ තැන්පතු ගිණුමට බැර කරන බව හා ඉදිරියේදී | හඳුනා නොගත් ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම මගින් මෙම වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මෙම ගිණුමට බැර කර ඇති ආදායම් නිවැරදිව හඳුනාගැනීමෙන් පසු නියමිත පරිදි ගිණුම්ගත කරන බව. | |
| (ඊ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළදී විශ්වවිද්‍යාලය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,791,447 ක පොත් සහ සඟරා 2,253 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | පරිත්‍යාග ලෙස ලැබුණු පොත් හා සඟරාවල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කරමින් මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (උ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු නමුත්, රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ලේඛකාධිකාරී යන තනතුරු සඳහා වෙන්කර තිබුණු නිල නිවාස වෙනුවෙන් එම නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.274,210 ක් අයකර නොතිබීම හා ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වේ. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2019 පිළිබඳව කොමිෂන් සභාවෙන් විමසීම් සිදු කළ බව හා විශ්වවිද්‍යාලයේ නිවාස කමිටු තීරණය මත නිවාස කුලී අයකළ හැකි බව එම කොමිෂන් සභාව විසින් දැන්වීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය විසින් නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් නිවාස කමිටු නිර්දේශය මත නිවාස කුලී සංශෝධනය කළ බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව හිඟ කුලී අය කළ යුතු අතර ඊට වඩා වෙනස් ආකාරයකින් කටයුතු කරන්නේ නම් ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය. |

### 1.5.2 විගණනයසඳහාලිඛිතසාක්ෂිනොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණු ගණනය කළහැකි අගය රු.262,772,409 ක් වූ ගිණුම් ශේෂ 03 කට අදාළ විස්තරාත්මක උප ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | 262,772,409 | විස්තරාත්මක උපලේඛන | මෙම කාරණා සඳහා වාර්ෂිකව උපලේඛන ලබා දෙන බව, විගණනය අපේක්ෂා කරන විස්තරාත්මක උපලේඛන දැනට විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කරමින් පවතින තොරතුරු පද්ධතිය තුළින් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට සිදු කර තිබුණු තොග සත්‍යාපන වාර්තා අනුව පීඨ 02 කට අදාළ තොග ශේෂය හා එදිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් තොග ශේෂය අතර රු.211,700 ක වෙනසක් පැවති නමුත් වෙසට හේතු ඉදිරිපත් නොකෙරුණි. | 211,700 | තොග වෙනසට හේතුවූ කරුණු ඇතුළත් සන්සන්දනාත්මක පැහැදිලි කිරීම්. | මෙම වෙනස සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතුවූ කරුණු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වර්ෂ 02 ත් වර්ෂ 17 ත් අතර කාල පරාසයක් තුළදී විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කර තිබුණු සේවකයින් වෙත නිකුත්කර තිබුණු රු.698,580 ක සේවක ණය අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | මේ වන විට අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති අයගෙන් ණය ශේෂ අය කර ගැනීමට හා තොරතුරු නොමැති නිලධාරීන්ගේ විස්තර සොයා බලා ඉදිරියේදී අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමටකටයුතු කරන බව. | ණය මුදල් කාල ප්‍රමාදයකින් තොරව කඩිනමින් අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.10 ඡේදය ප්‍රකාරව පර්යේෂණ අත්තිකාරම් දින 90 ක් තුළදී පියවිය යුතු වුවද, 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ නිලධාරීන් 09 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,008,427 ක අත්තිකාරම් 2022 මැයි 30 දින වන විටත් පියවා නොතිබුණි. | මේ වන විට පර්යේෂකයන් 07 දෙනෙකුගේ අත්තිකාරම් පියවා ඇති බව හා ඉදිරියේදී ඉතිරි පර්යේෂණ අත්තිකාරම් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බව. | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) හා 38(2) වගන්ති | එක් එක් අස්ථිත්‍යයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට උප කුලපති විසින්සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී පද්ධතීන් සියල්ල වෙනුවෙන් Intergraded University Management Software Solution පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා මූලික අදියරයන් සිදු කර පුහුණු සැසි පැවැත්වීම ආරම්භකළ බව, 2022 වර්ෂය සඳහා පිළියෙල කළ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ මෙම පද්ධතිය පිළිබඳ සමාලෝචන කටයුතු සිදු කිරීමට සැලැසුම් කර ඇති බව. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,492,092 ක්වූ ටෙන්ඩර් තැන්පතු, **2016** වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.1,729,464 ක්වූ විවිධ තැන්පතු හා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයේ සිට පැවත එන එකතුව රු.137,470,912 ක්වූ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය<br>----------------- | | | |
| | (i) 5.2.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල නිලධාරීන් 81 දෙදෙනකු වෙත නිවාස පහසුකම් ලබාදී තිබුණු නමුත් ස්ථිර නිවාස හිමි විවාහක නිලධාරීන්ගේ වැටුපෙන් මාසිකව සියයට 12.5 ක්ද, ස්ථිර නිවාස හිමි අවිවාහක නිලධාරීන්ගේ වැටුපෙන් මාසිකව සියයට 7.5 ක්ද වශයෙන් නිවාස කුලී අය නොකර ඒ වෙනුවට මාසිකව රු.750 ක් සහ රු.1,500 ක් වශයෙන් නිවාස කුලී අය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2019 පිළිබඳව කොමිෂන් සභාවෙන් විමසීම් සිදු කළ බව හා විශ්වවිද්‍යාලයේ නිවාස කමිටු තීරණය මත නිවාස කුලී අයකළ හැකි බව එම කොමිෂන් සභාව විසින් දැන්වීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය විසින් නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් නිවාස කමිටු නිර්දේශය මත නිවාස කුලී සංශෝධනය කළ බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 5.2.3 ඡේදය | සාද නිවාස ලෙස නම් කර තිබුණු නිවාස 31 ක් සඳහා ප්‍රමාණවත් ආර්ථික කුලියක් තක්සේරු කර අය කිරීමට කටයුතු නොකර එක් නිවාසයකට අවමය රු.400 සිට උපරිමය රු.750 ක් දක්වා මුදලක් අය කිරීමට කටයුතු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීමේදී විශ්වවිද්‍යාලය පවත්නා ස්ථානය හා සේවකයන් පිළිබඳ සලකා බැලීමෙන් පසු විශ්වවිද්‍යාල නිවාස කමිටුව මගින් ආර්ථික කුලිය තීරණය කළ හැකි බව දන්වා ඇති බව හා ඒ අනුව කමිටුව විසින් අදාල පරිදි සංශෝධනයන් සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් ප්‍රමාණවත් ආර්ථික කුලියක් තක්සේරු කර අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 ඡේදය | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සෑම තැනැත්තෙක්ම පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද, අධ්‍යයන කාර්ය මණ්ඩලය රාජකාරියට පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ඡේදය | පර්යේෂණයේ අවසන් වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් නොකරන නිලධාරීන් වෙත නිකුත් කර ඇති අත්තිකාරම් වාරික 04 කින් ඔවුන්ගේ වැටුපෙන් අයකරගත යුතු වුවද, 2017 හා 2018 වර්ෂවල අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණවලට අදාළ අවසන් වාර්තා පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු නිලධාරීන් වෙත 2020 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු රු.2,671,318 ක අත්තිකාරම් එම නිලධාරීන්ගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පර්යේෂණ කමිටුව මගින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිල නිවාසවල ජල බිල්පත් හා විදුලි බිල්පත් නිල නිවාසය භාවිතා කරන්නා දැරිය යුතු වුවද, උප කුලපති නිල නිවාසයේ රු.197,917 ක ජල හා විදුලි බිල්පත් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය | පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ එම යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2018 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණ 08 ක් සම්බන්ධයෙන් ප්‍රගති වාර්තා හා 2021 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු සියලුම පර්යේෂණයන්හි ප්‍රගති වාර්තා එම කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දැනට පර්යේෂණ ප්රගතිය මාස 06 න් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් පර්යේෂණ කමිටුව විසින් ලබාදී ඇති බව හා නිවැරදි ලෙස පර්යේෂණ ප්‍රගතිය ලබා නොදුනහොත් ඔවුන් වෙනුවෙන් කටයුතු සිදුකිරීමට පර්යේෂණ කමිටුව තීරණය කර ඇති බව. | කළමනාකරණ සේවා චක්‍රලේඛයප්‍රකාරව සියලුම පර්යේෂණයන්හි පර්යේෂණ ප්‍රගතිය ලබා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,552,762 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 140,295,545 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.143,848,306 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර මෙම වර්ධනයට රජයේ පුනරාවර්ථන ප්‍රදාන රු.158,500,000 කින් වැඩිවීම හා ගිවිසුම්ගත සේවා වියදම රු. 22,993,149 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2018 වර්ෂයේදී අනුමත කර ආරම්භ කර තිබුණු පර්යේෂණ 03 ක් සඳහා රු.2,700,000 ක් වූ ඇස්තමේන්තුගත මුදලින් සියයට 20 කට සමාන රු.550,000 ක් පමණක් වැයකර තිබුණු අතර මෙම පර්යේෂණ සැලසුම් කර තිබුණු පරිදි ක්‍රියාත්මක කිරීමට හා 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකිවී තිබුණි. | මේ සඳහා විවිධ ප්‍රායෝගික ගැටළු බලපා ඇති බව, නමුත් මින් ඉදිරියට පර්යේෂණවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය සොයා බලන බව හා එම නිලධාරින්ගෙන් පර්යේෂණ සැලසුම් කිරීමේ දුර්වලතාවයට හේතු විමසීමට කටයුතු කරන බව. | සැලසුම් කළ පරිදි පර්යේෂණ ක්‍රියාත්මක කිරීමට හා අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර ඒ පිළිබඳ පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය. |

**3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ඉදිරිපත් කර තිබුණු ලංසු සුරක්ෂණය නිසි ආකෘති පත්‍රවලට අනුව ඉදිරිපත් කර නොතිබීම, අවසන් වසර 05 හි නිමකළ ප්‍රධාන කොන්ත්‍රාත් 05 කට අදාළව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපි හා වැඩ නිමකළ බවට ලිපි ඉදිරිපත් කර නොතිබීම හා අවම සාමාන්‍ය වාර්ෂික ආදායම රු.මිලියන 52.5 ක් උපයා නොතිබීම යන කරුණු නොසලකා කොන්ත්‍රාත් වටිනාකම රු.17,500,000 ක්වූ අන්තර් සම්බන්ධතා කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා තෝරාගෙන තිබුණු ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වනවිට මෘදුකාංගය නිමකර භාර දිය යුතු වුවද, 2022 මැයි 02 වන දින වන විටත් එය නිමකර විශ්වවිද්‍යාලය වෙත භාරදී නොතිබුණි. | ප්‍රසිද්ධ කරන ලද ලංසු ලියවිලිවල නියමයන් හා කොන්දේසි ප්‍රකාරව ඉදිරිපත් කරන ලද ලංසු සුරක්ෂණය විශාල බැහැරවීමකින් තොරවූ බැවින්එය වලංගු ලංසු සුරක්ෂණයක් ලෙස පිළිගත් බවත්, ලංසුකරුවන් විසින් අවසන් වසර 05 තුළදී නිමකළ ප්‍රධාන කොන්ත්‍රාත් 05ක විස්තර හුදෙක් ලංසුකරුවන්ගේ අඛණ්ඩ පැවැත්ම සහ ක්ෂේත්‍රයේ නියැලෙන බව පිළිබඳ සොයා බැලීම සඳහා පමණක් බවත්, රු.මිලියන 52.5ක සාමාන්‍ය වාර්ෂික ආදායමසැලකුවේනම් කිසිවෙකු ඉදිරිපත් නොවන බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස වූ බැවින් හා අනුමත ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 17.5 ක් වූ බැවින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අවම සාමාන්‍ය වාර්ෂික | ප්‍රසම්පාදන කාර්යයේ විනිවිධභාවයතහවුරු වන පරිදි සැපයුම්කරුවන් තෝරාගත යුතු අතර කාර්යභාරය කඩිනමින් නිමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ආදායම රු.මිලියන 20ක් ලෙස ලංසු පත්‍රිකා මගින් ඉල්ලා ඇති බව හා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ පූර්ව සුදුසුකම් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් වූ බැවින් රු.මිලියන 17.5 කට තෝරාගත් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ලබාදුන්බව. රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් පද්ධතියේ කටයුතු නිසි පරිදි ඉටුනොවූ බැවින් කොන්ත්‍රාත් කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වාත් පසුව 2022 ජූනි 30 දින දක්වාත් දීර්ඝ කර ඇති බව. | |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිහින්තලේ පරිශ්‍රයේ ද්විත්ව සේවක නිල නිවාස 04 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ ගිවිසුම විශ්වවිද්‍යාලය විසින් 2019 පෙබරවාරි 20 දින අවසන් කර තිබුණි. මෙම ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ රු.3,952,742 ක් වූ කාර්යයසාධන සුරක්ෂණය 2018 පෙබරවාරි 12 දිනද රු.10,540,647 ක් වූ අත්තිකාරම් සුරක්ෂණය 2018 මාර්තු 05 වන දිනද කල් ඉකුත්වී තිබුණු අතර ඒවායේ කාලය දීර්ඝකරගැනීමට හෝ මුදල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. මේ නිසා ගිවිසුම් අවසන් කරන දින වන විට කොන්ත්‍රාත්කරුගෙන් අයකළ යුතුව තිබුණු මුළු මුදල රු.15,760,011 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත අත්තිකාරම් නිකුත්කර ඇති බව, සුරක්ෂණයන් දීර්ඝ කර ගැනීමට අදාළ දැනුම්දීම් ලිඛිතව සිදුකර ඇති බව, ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් කොන්ත්‍රාත්කරුවෙත අවශ්‍ය උපදෙස් හා නියෝග අඛණ්ඩව ලබා දී ඇති බව, කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය ලබාගෙන එම කොන්ත්‍රාත්කාර සමාගම හරහාම මෙම ව්‍යාපෘතිය අවසන් කර ගැනීම විශ්වවිද්‍යාලයේ උත්සාහය වූ බව, කෙසේ වුවද 2019 පෙබරවාරි 20 දින කොන්ත්‍රාත්තුව අවසන්කිරීම මගින් අහිමි වූ පාඩුව කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නෛතික ක්‍රියාවලිය සිදු කරමින් පවතින බව හා එවකට පැවති ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සැලකීමේදී විශ්වවිද්‍යාලයේ කළමනාකරණය නිවැරදි බව. | අත්තිකාරම් සුරක්ෂණය හා කාර්යයසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට නොහැකිවීම නිසා සිදුවී ඇති පාඩුව විශ්වවිද්‍යාල අරමුදලට පාඩුවක් නොවන ලෙස කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට හෝ වගකිව යුතු නිලධාරීන් වෙත අධිභාර කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) කළමනාකරණ අධ්‍යන පීඨයට වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.6,211,226 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව තෝරාගත් සැපයුම්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය මාස 02 ට ආසන්න කාල පමාවක් සහිතව යවා තිබීම හේතුවෙන් සැපයුම්කරු විසින් එය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ වනවිට ලංසු | මෙම ප්‍රසම්පාදන කාර්යය ඉටු වෙමින් පැවති කාලය තුළ කොවිඩ් වසංගතය නිසා රට වසා තිබුණු බැවින් කොන්ත්‍රාත්තුව ප්‍රධාන කිරීමේ ලිපිය 2021 ඔක්තෝබර් 05 දින යවා ඇති බව හා රටේ පැවති ආර්ථික තත්ත්වය හේතුවෙන් අදාළ මිලට කොන්ත්‍රාත්තුව කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු දන්වා ඇති බව. | ලංසු සුරක්ෂණය කල් ඉකුත්වීමට පෙර තෝරාගත් ලංසුකරු වෙත ලංසු ප්‍රදානය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

සුරක්ෂණය කල් ඉකුත්වී තිබුණු බැවින් එය  මුදල් කර ගැනීමට තිබුණු හැකියාව මගහැරී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණකගේ විෂයපථය තුළට ඇතුළත් නොවිය යුතු කාර්යයන් අභ්‍යන්තර විගණකගේ රාජකාරී පැවරුම් ලේඛනයේ හා අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඇතුළත් කර තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණකගේ ප්‍රධාන කාර්යභාරය වන විශ්වවිද්‍යාලයේ එක් එක් අංශවල අභ්‍යන්තර පාලන පද්ධතිවල ක්‍රියාකාරකම් පිළිබඳව දෛනිකව ඉහළ කළමනාකරණයට වාර්තා කිරීමේ කාර්යභාරය ඉටුවී නොතිබුණු අතර  අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වයද සීමාවී තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | අභ්‍යන්තර පාලන පද්ධතිවල ක්‍රියාකාරකම් පිළිබඳව දෛනිකව ඉහළ කළමනාකරණයට වාර්තා කිරීමේ කාර්යභාරය තහවුරු වන ලෙස හා  අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය සීමා නොවන ලෙස අභ්‍යන්තර විගණකගේ රාජකාරී පැවරුම් ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කළ යුතුය. |